# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1821/23 - 2013 ජූලි මස 30 වැනි අඟහරුවාදා - 2013.07.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 9/2011.

**1963 අංක 11 දරන මුදල් පනත**

72 වන වගන්තිය යටතේ වූ නියමය

කලින් කල සංශෝධිත පරිදි 1963 අංක 11 දරන මුදල් පනතේ 71 වන වගන්තිය සමඟ සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාවේ (2) වන අනු ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු ඉහත කී පනතේ 72 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජනාධිපති, මහින්ද රාජපක්ෂ වන මම, මෙහි උපලේඛනයෙහි විස්තර කර ඇති දේපළ වර්ෂ දෙදහස් දහතුනක් වූ ජූලි මස 30 දින සිට බලාත්මක වන පරිදි, 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ පිහිටුවන ලද මහජන බැංකුව වෙත මේ නියමය මගින් පවරා දෙමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2013 ජූලි මස 30 දින,
ජනාධිපති ලේකම් කාර්යාලය,
කොළඹ 01.

**උපලේඛනය**

1. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගල්බඩ කෝරලයේ, එගොඩපත තනිප්පේරු පත්තුවේ, මාවනැල්ල සුළුනගර සභා සීමාව තුල උතුවන්කන්ද මැතිවරණ සභා කොටසේ කොළඹ නුවර පාරේ අන්වාරම තිබෙන බණ්ඩාරවත්ත, බෙලිගහවත්ත සහ අම්බලමමුල වත්ත යන ඒකාබද්ධ ඉඩමෙන් බෙදා වෙන්කළ අංක 4 දරන කැබැල්ල පර්චස් තුනයි දශම දෙකයි එකක් (අ. 0 රූ. 0 ප. 3.21) විශාලත්වයට එල්. බී. බැද්දවල බලයලත් මිනින්දෝරු මහතා විසින් මැන සාදන ලද අංක 3090 දරන ප්ලෑනේ ප්‍රකාර මායිම් උතුරට සහ නැගෙනහිරට මෙම ප්ලෑනේ අංක 3 ද, දකුණටත් අංක 3 ද, බස්නාහිරට අංක 150 දරන ප්ලෑනේ අංක සී දරන කොටස ද යන මායිම් තුළ ඉඩම සහ වරිපනම් අංක 404 දරන ගොඩනැගිල්ල ද සමඟ ඊට අයත් සියලු දේ ද වේ.

මෙම ඉඩම කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 330/269 වැනි පත්‍රිරුවේ ලියාපදිංචි වී ඇත.

2. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, බෙලිගල් කෝරලයේ ඕතර පත්තුවේ නෙලුන්දෙණියේ තිබෙන බංගලාතැන්නේ හේන්වත්ත කියන, නැගෙනහිරට : අප්පුහාමි ගම්ආරච්චිට අයිති ඉඩම ද, දකුණට : බටුවනයාගේ වත්තේ ඉම ගල් ද, බස්නාහිරට : අගල ද, උතුරට : මහ පාර ද, යන මායිම් තුළ වී අමුනක වපසරිය ඇති ඉඩමෙන් සහ ඊට අයත් සියලු දෙයිනුත් නොබෙදූ තිස් දෙකෙන් එක (1/32) පංගුව හෙවත් කෑගල්ල දිසා අධිකරණයේ අංක : 17112 දරන නඩුවේ අවසන් තීන්දුවෙන් බෙදී එන කොටස හෝ කොටස් වේ.

මෙය කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 1072/206 වැනි පත්‍රිරුවේ ලියාපදිංචි වී ඇත.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය (සම්බන්ධිතයි)

3. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, අටකලන් කෝරලේ, පන්නිල් පත්තුවේ, නුගවෙල තිබෙන වර්ෂ 1993 ක් වූ අප්‍රේල් මස 01, වන දින, එම්. එස්. දියගම බලයලත් මිනින්දෝරු මහතා මැන සෑදූ අංක : 2857 දරන ප්ලෑනේ සඳහන්, යක්දෙස්සලාගේ කුඹුර හෙවත් ගෙදරගාවා කුඹුරේ කැබලි අංක : 6 දරන කොටස, පර්චස් දොළහකුත් දශම තුනයි තුනක (අක්. 0 රූඩ්. 0 පර්. 12.33) විශාලත්වයට මායිම් : උතුරට ඉහත කී අංක : 2857 දරන ප්ලෑනේ කැබලි අංක : 5 ද, නැගෙනහිරට ඊදණ්ඩ ලියද්ද ද, දකුණට එකී ප්ලෑනේ කැබලි අංක : 7 ද, බස්නාහිරට යක්දෙස්සලාගේ වත්ත ද යන මායිම් තුල ඉඩම සහ ඊට අයිති සියලු දේ ද වේ.

මෙය රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 309/90, 145 දරන පත්‍රිරුවේ ලියාපදිංචි වී ඇත.

4. ඉහත කී නුගවෙල තිබෙන ඉහත කී අංක : 2857 දරන ප්ලෑනේ සඳහන් යක්දෙස්සලාගේ කුඹුර හෙවත් ගෙදරගාව කුඹුරේ කැබලි අංක : 5 දරන කට්ටිය පර්චස් හතරයි දශම පහක (අක්. 0 රූ. 0 පර්. 4.5) විශාලත්වයට මායිම් : උතුරට එකී ප්ලෑනේ කැබලි අංක : 4 දරන කොටස ද, නැගෙනහිරට ඊදණ්ඩ ලියද්ද ද, දකුණට එකී අංක : 2857 දරන ප්ලෑනේ සඳහන් කැබලි අංක : 6 ද, බස්නාහිරට යක්දෙස්සලාගේ වත්ත ද යන මායිම් තුළ ඉඩම සහ ඊට අයිති සියලු දේ ද වේ.

මෙය රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 309/90, 145 දරන පත්‍රිරුවේ ලියාපදිංචි වී ඇත.

08 - 565

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.